# අංජනම් එළියක් යනු X-Ray තරම් දියුණු තාක්ෂණයක්

## ගුප්ත විද්‍යාවෙන් මිදුණු නූතන මිනිස් මොළය - 2


සාරගර්භ වූ ගුප්ත විද්‍යාව අෂ්ට කර්මයකින් යුක්ත වේ. අද අපේ මාතෘකාවට අදාළ අංජනම් එළි බැලීම එහි උච්චාටන නම් වූ කොටසට අයත් වේ. අංජනම් එළි බැලීම පුළුල් පරාසයක් තුළ විද්‍යාත්මකව හැදෑරිය යුතු කදිම පැතිකඩකි. මේ විෂය රසවත් වන්නා සේම ඒ තුළ මහා විද්‍යාත්මක රහසක්ද සැඟවී ඇත. අංජනම් නැතහොත් අඳුන් එළි බැලීම පිළිබඳ විවිධ රටවල ගවේෂණාත්මක තොරතුරු රැසක් මා සතුව ඇත. ඒ සියලු තොරතුරු විද්‍යාත්මකව පැහැදිලි කිරීමට ඉදිරි ලිපි තුළින් බලාපොරොත්තු වෙමි. අංජනම් එළි පෙනීම සඳහා බලපාන්නා වූ විද්‍යාත්මක සංසිද්ධිය හඳුනා දීමට ප්‍රථම එහි පසුබිම පිළිබඳ මඳක් විමසා බලමු.

### ඉතිහාස කතාව

අංජනම් එළි බැලීම ආරම්භ වන්නේ, රාම - රාවණා යුද්ධයෙන් පසුව බවයි බොහෝ ගුප්ත විද්‍යාඥයන්ගේ මතය. නමුත් අංජනම් එළි බැලීම පිළිබඳ ගුප්ත විද්‍යාත්මක ක්‍රම ශිල්පය ප්‍රථමයෙන්ම කවුරුන් විසින් සොයා ගත්තාද යන්න නිශ්චිත පිළිතුරක් තවමත් හඳුනාගෙන නැත. රාම - රාවණා යුද්ධයෙන් පසුව අංජනම් එළි බැලීම ආරම්භ වූවා නම් මේ අනර්ඝ සොයා ගැනීම කරන්න ඇත්තේ හෙළදිවවාසීන් බවයි මගේ මතය. මෙය අපෙන් ඉන්දියාවටත් එතැනින් අරාබිය, මිසරය හා බටහිර රටවලටත් ව්‍යාප්ත වූ බව පෙනේ. එය අපේ හෙළදිවෙන් අන් රටවලට සංක්‍රමණය වූ බව සනාථ කරන්න මා සතුව ඇති සාක්ෂි බොහෝය. ඉන් පළමුවැන්න නම් රාම - රාවණා කතා පුවතයි. රාම - රාවණා යුද්ධයේදී ප්‍රධාන මාර්ගෝපදේශකයා සේම චරපුරුෂ සේවයේ ප්‍රමුඛයා වූයේ හනුමන්තාය. ඔහු වානරයකු බව කියැවේ. එසේ නම් හනුමන්තාගේ මව අංජනාද වානර කුලයේම විය යුතුය. මේ හනුමන්තා නමැති වානරයාට රාම - රාවණා යුද සමයේදී කිසිදු ගුප්ත බලයක් තිබුණේ නැත. නමුත් මේ මවත් පුතාත් වානරයන් වශයෙන් සිටිමින් රාම ඇතුළු පිරිසට දිවි හිමියෙන් චරපුරුෂ සේවයේ යෙදෙන්න ඇත. එහිදී රාවණා රජුගේ සේනාව අතින් මේ වානර මව සහ පුතා විනාශයට පත් වී දේව ආත්ම හෝ වෙනත් ගුප්ත ආත්ම ලබා රාම - ලක්ෂ්මණ - සීතා ආරක්ෂා කරන්න ඇතැයි අපට පිළිගැනීමට පුළුවන. ඉන් පසු මහා නුවණක් හිමි රාවණා රජු විසින් මේ වානර පුතා සහ මවගේ මතු ආත්මයන් සොයා බලා ඔවුන් දෙදෙනා අංජනම් එළියක් මඟින් අල්ලාගෙන රාම - ලක්ෂ්මණ පිළිබඳ තොරතුරු ලබා ගැනීමට උත්සාහ කරන්න ඇතැයි අපට සිතිය හැකිය. මෙදා පටන් හෙළදිව අංජනම් නමැති ගුප්ත විද්‍යාත්මක සංකල්පය බිහිවන්න ඇතැයි මට හැඟේ. නමුත් මේ හනුමන්තා හා අංජනම් දේවිය රාම සහ ලක්ෂ්මණ පිළිබඳ සත්‍ය වසන් කළ බව නම් ඉඳුරාම කිව හැකිය. එයට හේතුව මොවුන් දෙදෙනා රාමගේ පාර්ශ්වයේ අය වීමයි. අදටත් අඳුන් බැලීමේදී අයහපත් දේට හනුමන්තා හා අංජනම් දේවියගෙන් රැකුලක් නොලැබේ. එවැනි දෙයක් දුටු විට අදටත් මේ දෙදෙනා සත්‍ය වසන් කොට අඳුන බලන්නා මුළාවට පත්කරයි.

හෙළදිවෙන් අංජනම් එළි බැලීම ආරම්භ වුණා යැයි කීමට තවත් මතයක් ඇත. අංජනම් ගැන කියැවෙන බහුතරයක් දෙවිවරු හෙළදිව කලක් මිනිස් ආත්ම ලැබූවන් බව පෙනේ. සුමන, කන්දකුමාර, විෂ්ණු, මහසෝන්, රාවණ, නාථ, සූනියම් මින් කිහිපදෙනෙකි. මාගේ මීළඟ අදහස නම් මේ අඩිබලැති අඳුන් සඳහා උපයුක්ත කර ගන්නා ඖෂධ සියල්ලම දේශීය ඒවා වීමයි. මේ මත ත්‍රිත්වයට අනුව බලන කල්හි අංජනම් එළි බැලීම පළමුවෙන්ම ලක්දිවෙන් උපන් බැව් පසක් වේ.

සාමාන්‍යයෙන් අංජනම් බැලීමේදී සිදුවන්නේ දෘශ්‍ය ආලෝකය අවලෝකනය කිරීමයි. එම අවලෝකනය පොළොව යට, භූමිය මතුපිට ශරීර අභ්‍යන්තරය ආදී සිතන ඕනෑම තැනකට යැවිය හැකි X-ray කිරණ විශේෂයක් ලෙස හඳුනා ගත හැකිය. මේ X-ray කිරණ ඔස්සේ ඇතිවන රූපමය තරංග තුළින් අප සිතන දෑ රූපවාහිනී දසුන් පෙළක් සේ දැකීමටත් හඬ ශ්‍රවණය කිරීමටත් පුළුවන. නූතන වෛද්‍ය විද්‍යාව විසින් රෝග නිධාන සෙවීම සඳහා




X-ray කිරණ උපයෝගී කර ගැනීමට බොහෝ කලකට පෙර ගුප්ත විද්‍යාඥයින් මේ තාක්ෂණය සොයා ගත්තා යැයි ඇසීම පවා විස්මය දනවනසුලුය. ඉහත රූප සටහන බලන්න.

A - X-ray කිරණ සහිත ආලෝක කදම්බ පැමිණීම.

B - ඇස / කන ආධාරයෙන් දෘෂ්ටි හෙළීම හා විද්‍යුත් චුම්බක තරංග (චිත්ත බලය) C වෙත යොමු කිරීම. නැවත විද්‍යුත් චුම්භක තරංග, X-ray කිරණ හා අධි සාන්ද්‍රිය ඖෂධ විසින් ගොඩනංවනු ලබන සෙවණැලි රූප (තමන් සිතන මනුෂ්‍ය, දේව, යක්ෂ ආදී ඕනෑම රූපයක්) විද්‍යුත් චුම්භක තරංග බවට පත් කරමින් (KHz පරාසයේ ගුවන් විදුලි හා රූපවාහිනී තරංග) අඳුන බලන්නා වෙත නැවත සම්ප්‍රේෂණය වීම.

C - අධි සාන්ද්‍රිය ඖෂධීය ගුණ හා ශබ්ද තරංග මුසු කළු ආලේපිතය.

D - චිත්ත බලය, X-ray කිරණ, අධි සාන්ද්‍රිය ඖෂධ ගුණ සහ මන්ත්‍ර ශබ්ද විසින් ගොඩනඟන සෙවණැලි රූප.

E - බලන්නා විසින් සිතන පරිදි ආකාශයට, පොළොව මතුපිටට, පොළව යටට හෝ ශරීර අභ්‍යන්තරයට සෙවණැලි රූප ගමන් කරන ආකාරය.

F - අඳුන බලන්නාගේ අන්තය (ඇස සහ කණ)

ඉහතින් දැක්වෙන්නේ අංජනම් එළි බැලීමේදී සිදුවන විද්‍යාත්මක සන්සිද්ධියයි. මෙය රාත්‍රී කාලයේදී හෝ අඳුරේදී බලන විට ආලේපිතයට ඉදිරියෙන් පහනක් තබා එහි ආලෝකය අවලෝකනය කරගනු ලැබේ.

මට කුඩා කල හොඳින් අංජනම් පෙනුණු නිසාත් එය අත්දුටු නිසාත් මේ විෂය ගැන ගවේෂණය කරන්න උත්සුක වුණෙමි. වර්තමාන ලෝකයේ ජීවත් වන අපට මේ මාහැඟි විද්‍යාව මනා ලෙස අධ්‍යයනය කළ හැකි නම් ඉන් අත්කරගත හැකි පල ප්‍රයෝජන ඉමහත්ය. වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රය (රෝග නිධාන හා ප්‍රතිකාර විධි සෙවීම) නීති ක්ෂේත්‍රයට (අපරාධකරුවන් සෙවීම, චරපුරුෂ සේවය, යුක්තිය පසිඳලීම) ආදියට මේ විෂය එක සේ වැදගත් වනු ඇත.

අතීත රජ දරුවන් පවා ඔත්තු බැලීම, ආරක්ෂාව, මහජන වශීය (ප්‍රසාදය) ලබා ගැනීම සඳහා අංජනම් මුදු පැලඳූ බැව් පුරාණ තඹ පත්වලින් සනාථ වේ. එක්තරා තඹ පතක "රාසිං දෙයියන් පැලැඳි අංජනම් මුද්දට කලස පත්‍රිකා, බඳුලතා, දේවදාල, දිවසතුරු ආදී..." ඖෂධ යොදා ගත් බව දැක්වේ. එපමණක් නොව නැපෝලියන්, අක්බාර්, අසෝක, මහා පරාක්‍රමබාහු, දුටුගැමුණු වැනි නරපතියෝ පවා මේ අංජනම් මුදු පැලැඳි බවට ඉතිහාස ගත මූලාශ්‍ර සාක්ෂි සපයයි. අංජනම් අතර කළුවර අඳුන ඉතා ප්‍රසිද්ධ වූවකි. මේ අඳුනෙන් තෙල් ඇඟ ගැල්වූ පසු කිසිවකුට නොපෙනී ගමන් කළ හැකි බව කියැවේ. වර්තමානයේ පවා ඉතා පහසුවෙන් සාදා ගත හැකි එවැනි අංජනම් එළි (විවිධ රටවලට අදාළ) පිළිබඳ ගුප්ත විද්‍යාත්මක හා නූතන විද්‍යාත්මක විවරණයන් පසු කාලයේදී ඔබ අතට පත් කරමි.

මතු සම්බන්ධයි......



උපුල් එස්. දොඹේපොළ
පුරාණ අන්තරීක්ෂ විද්‍යා ගවේෂක
0772042708

